**මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා ආයෝජන වැඩසටහන - 2 - 2016**

---

මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා ආයෝජන වැඩසටහනේ - 2 ව්‍යාපෘතියේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ ආසියානු සංවර්ධන බැංකුව (ආසබැ) සහ ව්‍යාපෘති පරිපාලන අත්පොතේ V පරිච්ඡේදය හා 2014 ජුනි 03 දින එළඹි අංක 3029-එස්ආර්අයි දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.05 වගන්තිය සහ 3030 - එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා ආයෝජන වැඩසටහනේ - 2 ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය වර්තමානයේ නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මහ කොළඹ ප්‍රදේශයේ ජල සම්පාදන හා අපජලය සේවා පිළිබඳ කාර්යක්ෂමතාවය හා මූල්‍ය තිරසාරත්වය වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම් අනුව, ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 15,340 කට සමාන එජඩො මිලියන 118 ක් වූ අතර ඉන් රු.මිලියන 9,100 කට සමාන එජඩො මිලියන 70 ක් හෙවත් ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැයෙන් සියයට 59.3 ක් ආසියානු සංවර්ධන බැංකුවේ සාමාන්‍ය ප්‍රාග්ධන සම්පත් මගින් මූල්‍යයනය කිරීම සඳහා හා රු.මිලියන 2,340 කට සමාන එජඩො මිලියන 18 ක් හෙවත් ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැයෙන් සියයට 15.3 ක් ආසියානු සංවර්ධන අරමුදලෙන් මූල්‍යයනය කිරීම සඳහා එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 3,900 කට සමාන එජඩො මිලියන 30 ක් හෙවත් සියයට 25.4 ක් ශ්‍රී ලංකා රජයේ දායකයෙන් අපේක්ෂා කර තිබුණි. තවද ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැයෙන් රු.මිලියන 13,917 කට සමාන එජඩො මිලියන 107.05 ක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් සිදු කිරීමට අපේක්ෂිත ව්‍යාපෘතියේ කාර්යයන් සඳහා වෙන් කර තිබූ අතර රු.මිලියන 1,423 කට සමාන එජඩො මිලියන 10.95 ක් කොළඹ මහනගර සභාව විසින් සිදු කිරීමට අපේක්ෂිත ව්‍යාපෘතියේ කාර්යයන් සඳහා වෙන්කර තිබුණි. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතියේ කාර්යයන් පිළිබඳ නිරීක්ෂණයන්ගෙන් මෙම වාර්තාව සමන්විත වේ. ව්‍යාපෘතිය එහි කාර්යයන් 2014 සැප්තැම්බර් 23 දින ආරම්භ කරන ලද අතර 2019 ජුනි 30 දින වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ

හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා  පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘතියේ කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරුවනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල  දක්වා ඇති වියදම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘතියේ වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනාගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක සහ අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව,

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඒ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

------------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

----------------

**2.1 මතය**

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇතිවන බලපෑම හැරුණු විට, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව.

(ඈ) ණය ගිවිසුම්වල නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව, සහ

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවේ පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව සහ,

(ඊ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

--------------------------------------

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

------------------------

එකතුකල අගය මත බදු ගෙවීම් එකතුව රු.මිලියන 10.61 ක් කෙරීගෙන යන වැඩ යටතේ දැක්වීම වෙනුවට රජයෙන් ලද දායක මුදලට එරෙහිව හිලව් කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ කෙරීගෙන යන වැඩ වටිනාකම රු.මිලියන 92.87 ක් සහ රජයෙන් ලද දායක මුදල් රු.මිලියන 108.02 ක් පිළිවෙලින් එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

**2.2.2 නීති රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම්**

**------------------------------------------**

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) 2017 අගෝස්තු 07 දිනැති අංක එම්ඕඑෆ්පී/ඊආර්ඩී/2007/02 දරන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ චක්‍රලේඛය අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 හෝ එදිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද, ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2017 අප්‍රේල් 25 දිනදීය.

(ආ) ආසියානු සංවර්ධන බැංකුවේ ව්‍යාපෘති පරිපාලන අත්පොතේ 17 වන වගන්තියට අනුව, ඉදිකිරීම් කාලය තුල පොලී සහ අනෙකුත් ගාස්තු ප්‍රාග්ධනිත කල යුතුය. කෙසේ වුවද, ව්‍යාපෘතිය මගින් දරා තිබූ රු.මිලියන 1.58 ක් වූ පොලී සහ බැඳීම් ගාස්තු රු.මිලියන 15.21 ක් ව්‍යාපෘතිය දැරූ පිරිවැය ලෙස ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඇ) 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 6(1)(අ) වගන්තිය අනුව, රු.මිලියන 5 ක් හෝ ඊට වැඩි කොන්ත්‍රාත් භාරගන්නා ලද කොන්ත්‍රාත්කරුවන් පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් යටතේ ලියාපදිංචි වී තිබිය යුතුය. තවද, කොන්ත්‍රාත් පිරිනැමීමෙන් පසු, දින 60 ක් ඇතුලත, කොන්ත්‍රාත් ගිවිසුම පොදු කොන්ත්‍රාත් රෙජිස්ටාර් වෙත ලියාපදිංචි කළ යුතුය. කෙසේ වුවද, ව්‍යාපෘතියේ කාර්යයන්වල යෙදී ඇති කොන්ත්‍රාත්කරුවන් ඉහත අවශ්‍යතාවලට අනුකූලව කටයුතු කර නොතිබුණි.

(ඈ) රජයේ මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.3 වගන්තිය ප්‍රකාරව, දකුණු සහ බටහිර කොළඹ ආදායම් නොලබන ජලය සඳහා වූ පුනරුත්ථාපන පද්ධතියට අදාල විධිමත් කොන්ත්‍රාත් ගිවිසුම් රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අත්සන් කිරීම වෙනුවට ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ සභාපති විසින් අත්සන් කර තිබුණි.

**3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය**

**-----------------------------------**

**3.1 අරමුදල් උපයෝජනය**

**-------------------------**

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා 2016 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනයට අදාළ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම්වලට අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයට මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2016 දෙසැම්බර් 31 දිනට | |
| | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ආ ස බැ | 88 | 11,440 | 79.95 | 10.394 | 1,034.00 | 6.70 | 998.30 | 7.11 | 1,058.70 |
| ශ්‍රී ලං ර | 30 | 3,900 | 27.10 | 3,523 | 460.41 | 0.63 | 95.00 | 0.79 | 118.62 |
| | 118 | 15,340 | 107.05 | 13,917 | 1,494.41 | 7.33 | 1,093.30 | 7.90 | 1,177.32 |

ඉහත තොරතුරුවලට අනුව, ව්‍යාපෘති ගිවිසුමට අනුව සැලසුම් කර තිබූ මාස 60 ක මෙහෙයුම් කාලයෙන් 2016 දෙසැම්බර් 31 දිනට මාස 31 ක් ගතවී තිබුණද, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය සඳහා වෙන්කර තිබූ රු.මිලියන 10,394 කට සමාන එජඩො මිලියන 79.95 ක වෙන්කිරීමෙන් රු.මිලියන 1058.70 කට සමාන එජඩො මිලියන 7.11 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

තවද, ව්‍යාපෘතියේ සමස්ත කාලපරිච්ඡේදය ආවරණය වන පරිදි වගකීම් සහිතව මූල්‍ය හා භෞතික ඉලක්ක මතුකර දක්වමින් සැලසුම්කළ කාලපරිච්ඡේදය තුල වෙන්කරන ලද සම්පත් යොදාගැනීම මගින් ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීම තහවුරු කර ගැනීම සඳහා විස්තරාත්මක සැලැස්මක් නොවීම හේතුවෙන් නිශ්චිත ව්‍යාපෘති කාලය තුල ව්‍යාපෘති කාර්යයන් නිමකිරීම සැක සහිත බව නිරීක්ෂණය විය.

## 3.2 භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතිය මගින් ඉදිරිපත් කර තිබූ ප්‍රගති වාර්තාවලට අනුව, සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපෘතියේ සමස්ත භෞතික ප්‍රගතිය සියයට 3.66 ක් විය. තවද කොන්ත්‍රාත් 13 කින්, ප්‍රදානය කිරීමට සැලසුම් කර තිබූ කොන්ත්‍රාත් 07 ක් 2016 දෙසැම්බර් 31 දක්වා ප්‍රදානය කර නොතිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ කාර්යයන් 2019 ජුනි 30 දින වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණද, බටහිර කොළඹ නගරයේ ආදායම් නොලබන ජලය සඳහා වූ පද්ධති පුනරුත්ථාපනය සඳහා පිරිනමා තිබූ කොන්ත්‍රාත්තුවේ නිම කිරීමේ දිනය ව්‍යාපෘති කාලපරිච්ඡේදයෙන් පසු 2021 මාර්තු 31 ලෙස තීරණය කර තිබුණි.

(ආ) කොළඹ නගරයේ බටහිර කොටසේ පද්ධති පුනරුත්ථාපනය සඳහා වූ කොන්ත්‍රාත්තුව සඳහා ලංසු කැඳවීම සඳහා 2014 දෙසැම්බර් 01 දින ප්‍රචාරණය කර තිබූ අතර මාස 22 ක් ගතවීමෙන් පසු 2016 ඔක්තෝබර් 20 දින අදාල කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. කෙසේ වුවද, කොන්ත්‍රාත්තුවේ කාර්යයන් 2016 දෙසැම්බර් 31 දිනවන විටත් ආරම්භකර නොතිබුණි. තවද කොළඹ නගරයේ දකුණු කොටසේ පද්ධති පුනරුත්ථාපනය සඳහා වූ කොන්ත්‍රාත්තුව සඳහා වූ සැලසුම් හා ඉදිකිරීම්වලට අදාල ලංසු ලේඛන අමාත්‍ය මණ්ඩලය මගින් පත්කළ සම්මත ප්‍රසම්පාදන කමිටුවක් මගින් 2014 මාර්තු 20 දින අනුමත කර තිබුණද කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණේ අනුමැතිය ලැබී මාස 34 ක් ගතවීමෙන් පසු 2017 ජනවාරි 26 දිනදීය.

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.14(අ) ට අනුව, සියලුම අනාගත ලංසුකරුවන්හට එකම තොරතුරු සපයනු ලැබිය යුතු අතර, අතිරේක තොරතුරු ලබා ගැනීම සඳහා ඔවුන්ට සමාන අවස්ථා ලබාදිය යුතුය. ප්‍රමාණ පත්‍රයේ සඳහන් අයිතම කිහිපයක්ම පසුව වෙනස්කර තිබුණද, කලින් ප්‍රසිද්ධ කර තිබූ අවම ලංසුකරු විසින් ඉදිරිපත් කළ ප්‍රමාණ පත්‍රයේ සඳහන් අයිතමයන්ට අදාල තොරතුරු සියලුම ලංසුකරුවන්ට විධිමත්ව සන්නිවේදනය කළ බවට විගණනයේදී සැක සහිත විය. ලංසුකරු විසින් ඉදිරිපත් කළ මිල ගණන් ව්‍යාපෘතිය විසින් පරස්පර ලෙස වෙනස් කොට ඒ අනුව ඇගැයීම් කර තිබුණි.

### 3.4 මූල්‍ය පාලනය පිළිබඳ ගැටළු

2010 ජූලි දිනැති අංක 05 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය සහ මුදල් රෙගුලාසි 133 අනුව, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය මගින් ව්‍යාපෘති කාර්යයන් විගණනය කිරීම අවශ්‍යය. කෙසේ වුවද, ව්‍යාපෘතිය මගින් සිදුකළ විගණන කාර්යයන් සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන වාර්තාවක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.